නමො තස්ස භගවතො අරහතො

නමස්කාර කරමි (ඒ) වහන්සේට භාග්‍යවත් වූ අර්හත් වූ

සබ්බධම්මේසු අප්පටිහතඥාණචාරස්ස

සියලු ධර්මයන්හි නොපැකිල ඥාන හැසිරීම් සහිත වූ

දසබලධරස්ස චතුවේසාරජ්ජවිසාරදස්ස

දසබලධාරී වූ චතුර්වෛශාරදත්වවිශාරද වූ

සබ්බසත්තුත්තමස්ස ධම්මිස්සරස්ස

සියලු සත්ත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ

ධම්මරාජස්ස ධම්මස්සාමිස්ස තථාගතස්ස

ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ

සබ්බඤ්ඤුනො සම්මාසම්බුද්ධස්ස !!!

සර්වඥ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට !!!

# බුද්ධ වන්දනා - 01

01.

**නමාමි වීර පාදෙ තෙ - චක්කඞ්කිත තලෙ සුභෙ**

නමස්කාර කරමි වීරයන්වහන්ස පාදයන් ඔබගේ චක්‍ර ලක්ෂණයෙන් යුත් පතුල් සහිත සුභ වූ

**වන්දිතෙ නරදෙවෙහි - අමතං දෙහි වන්දිතෙ**

වදිනු ලැබෙත් දෙව් මිනිසුන් විසින්, අමෘතය දෙනු මැන (වදින්නවුන්ට) වදිනු ලැබෙත් ම

02.

**ලොකනාථ තුවං එකො - සරණං සබ්බපාණිනං**

ලොවට පිහිට ඔබ ම ය එක ම සරණ වූ සියලු ප්‍රාණීන්හට

**ලොකෙ තයා සමො නත්ථි - තාරෙහි ජනතං බහුං**

ලොවෙහි ඔබ හා සම වූවෙක් නැත එතෙර කරවනු මැන ජනතාව බොහෝ

03.

මහණ්ණවෙ මයං භන්තෙ - නිමුග්ගා දීඝසම්භවෙ

මහා (භව) සාගරයෙහි අප (භාග්‍යවතුන්) වහන්ස ගිලී (සිටියෙමු) දීර්ඝ කාලයක් පුරා

අප්පතිස්සා අප්පතිට්ඨා - සංසරාම චිරං තහිං

(ආර්යයන්ට) අකීකරු වීම නිසා පිහිටක් නො ලැබ සැරිසැරුවෙමු බොහෝ කලක් එහි

04.

එතරහි තුම්හෙ ආපජ්ජ - පතිට්ඨං අධිගච්ඡරෙ

මෙකල්හි ඔබ වහන්සේගේ පැමිණීමෙන් පිහිටක් (විශේෂයෙන්) ලැබුවෙමු

තුම්හාකං වන්දනං කත්වා - උත්තිණ්ණම්හ භවණ්ණවා

ඔබ වහන්සේ(ලා)ට වන්දනා කිරීමෙන් ගොඩට පැමිණියෙමු භව සාගරයෙන්

05.

තුවං බුද්ධො තුවං සත්ථා - තුවං මාරාභිභූ මුනි

ඔබ ම ය බුදුහු ඔබ ම ය ශාස්තෘහු ඔබ ම ය මරුන් අභිභවනය කළ මුනිහු

තුවං අනුසයෙ ඡෙත්වා - තිණ්ණො තාරෙසිමං පජං

ඔබ ම අනුශය (සියුම් කෙලෙස්) සිඳ තරණය කරන ලදහ. තරණය කරවන්නෙහි මෙම ප්‍රජාව (ද)

06.

# උපධී තෙ සමතික්කන්තා - ආසවා තෙ පදාලිතා

උපාදානයන් ඔබ ගේ මැනවින් අතික්‍රමණය කරන ලදහ ආශ්‍රවයන් ඔබගේ බිඳහරින ලදහ

# සීහොව අනුපාදානො - පහීනභයභෙරවො

සිංහයකු මෙන් උපාදාන රහිත ව ප්‍රහානය කරන ලද භය සහ බියජනක අරමුණු සහිත ව

07.

# බ්‍රහ්මභූතං අතිතුලං - මාරසෙනප්පමද්දනං

ශ්‍රේෂ්ඨත්වයට පත් වූ, තුලනය කිරීම ඉක්ම වූ, මාර සේනා මර්දනය කරන්නා වූ (ඔබ වහන්සේ)

# කො දිස්වා නප්පසීදෙය්‍ය - අපි කණ්හාභිජාතිකො

කවුරුන් නම් දැක නො පහදින්නේද ? හැරත් පහත් උප්පත්ති ඇත්තෙක් (ගැන කවර කථාද?)

08.

# උසභං පවරං වීරං - මහෙසිං විජිතාවිනං

ශ්‍රේෂ්ඨ වූ (ආජානීය වූ) අති උතුම් වූ (මහා) වීර වූ මහාසෘෂි වූ දිනන ලද කෙලෙස් රාජ්‍ය සහිත වූ

# සුවණ්ණවණ්ණං සම්බුද්ධං - කො දිස්වා නප්පසීදති

ස්වර්ණ වර්ණ වූ සම්බුදුරජාණන් වහන්සේ කවුරුන් නම් දැක නො පහදී ද ?

09.

හිමවාවාපරිමෙය්‍යො - සාගරොව දුරුත්තරො

හිමාල පර්වතය සේ ප්‍රමාණ කළ නො හැකි ද   සාගරය සේ   තරණය කිරීම දුෂ්කර ද

තථෙව ඣානං බුද්ධස්ස - කො දිස්වා නප්පසීදති

එබඳු ම ය   ධ්‍යානය   බුදුරජුන්ගේ   කවුරුන් නම්   දැක   නො පහදී ද ?

10.

වසුධා යථාප්පමෙය්‍යා - චිත්තා වනවටංසකා

මහපොළොව   යම් සේ   අප්‍රමෙය්‍යා ද   විසිතුරු   වන   ලැහැබින් (යුක්ත ද?)

තථෙව සීලං බුද්ධස්ස - කො දිස්වා නප්පසීදති

එබඳු ම ය   සීලය   බුදුරජුන්ගේ   කවුරුන් නම්   දැක   නො පහදී ද ?

11.

අනිලජොව අසඞ්ඛොභො - යථාකාසො අසඞ්ඛියො

මහසයුර මෙන්   නො කැලඹිය හැකි ද   යම් සේ   අහස   නො ගිනිය හැකි ද

තථෙව ඤාණං බුද්ධස්ස - කො දිස්වා නප්පසීදති

එබඳු ම ය   ඥානය   බුදුරජුන්ගේ   කවුරුන් නම්   දැක   නො පහදී ද ?

# පුණ්‍යානුමෝදනාව

කෝටි ලක්ෂයක් සක්වල / සියලු ආර්යයන් වහන්සේලා ද / සියලු සත්පුරුෂයන් වහන්සේලා ද /

අපගේ නමස්කාරය පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා ! පිළිගන්නා සේක්වා !

කෝටි ලක්ෂයක් සක්වල / සියලු ආර්යයෝ ද / සියලු සත්පුරුෂයෝ ද / සහම්පතී මහා බ්‍රහ්ම රාජයාණෝ ද / සනත්කුමාර මහා බ්‍රහ්ම රාජයාණෝ ද / සටීකාර මහා බ්‍රහ්ම රාජයාණෝ ද / තිස්ස මහා බ්‍රහ්ම රාජයාණෝ ද

ශුද්ධාවාසවාසී වූ / සියලූ ම අර්හත් මහා බ්‍රහ්මයෝ ද / සියලූ ම අනාගාමී මහා බ්‍රහ්මයෝ ද / බ්‍රහ්ම ලෝක වාසී වූ / සියලූ ම ආර්යය වූ බ්‍රහ්මයෝ ද / සියලූ ම සත්පුරුෂ වූ බ්‍රහ්මයෝ ද / සදිව්‍ය ලෝක වාසී / සියලු ආර්යයන් වහන්සේලා ද / මහා මෛත්‍රී බෝසතාණන් වහන්සේ ද / සියලූම මහා බෝසතාණන් වහන්සේලා ද / මහා මෛත්‍රී බෝසතාණන් වහන්සේ සමග / පාරමී පුරන්නා වූ / මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනයෙහි / භික්ෂුභාවය, / භික්ෂුණීභාවය, / උපාසකභාවය සහ / උපාසිකාභාවය ලබන්නා වූ පිරිස ද / අනාගත බුදුරජාණන් වහන්සේලාගේ ශාසනවල / භික්ෂුභාවය, / භික්ෂුණීභාවය, / උපාසකභාවය සහ / උපාසිකාභාවය ලබන්නට / පාරමී පුරන්නා වූ පිරිස ද / ශක්‍ර දේවේන්ද්‍රයාණන් වහන්සේ ඇතුළු / තෙතිස් මහා දෙව් රජුන් ද / උන්වහන්සේලාගේ පිරිස ද / ධෘතරාෂ්ඨ, / විරූඪ, / විරූපාක්ෂ, / වෛශ්‍රවණ නම් වූ / සතර වරම් රජවරුන් ද / උන්වහන්සේලාගේ පිරිස ද / සූර්ය දිව්‍ය රාජයාණන් වහන්සේ ද / උන්වහන්සේගේ පිරිස ද / චන්ද්‍ර දිව්‍ය රාජයාණන් වහන්සේ ද / උන්වහන්සේගේ පිරිස ද / සීත වළාහක, / උෂ්ණ වළාහක, / අබ්භ වළාහක, / වාත වළාහක, / වැස්ස වළාහක දෙව් රජුන් ද / උන්වහන්සේලාගේ පිරිස ද / ස්වර්ණමාලී මහා චෛත්‍ය රාජයාණන් වහන්සේ ද / ජය ශ්‍රී මහා බෝධිරාජයාණන් වහන්සේ ද ඇතුළු / සියලු සිද්ධස්ථාන ආරක්ෂා කරන්නා වූ / අප්‍රමාදී වූ / ධෛර්යය සම්පන්න වූ දෙවියෝ ද / අනෙකුත් විශේෂ ස්ථාන ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද / අපගේ ආරක්ෂක දෙවියෝ ද / අපගේ ඥාතිමිත්‍රාදීන් ආරක්ෂා කරන්නා වූ දෙවියෝ ද /

අප විසින් රැස් කරගන්නා ලද්දා වූ / මේ සියලු ම පින්, / අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා !

ඔවුන් පතන්නා වූ බෝධියකින් / සුවසේ නිවන් දකිත්වා ! එතෙක් නිදුක් නිරෝගී / සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා ! කැමති කැමති තාක් දේ / නිදුකින් ලබත්වා ! කැමති කැමති තාක් දේ / නිදුකින් වඩත්වා ! කැමති කැමති තාක් දේ / නිදුකින් දෙත්වා ! කලට වේලාවට, / ශාසනය ආරක්ෂා කරත්වා ! දේශනය ආරක්ෂා කරත්වා ! අප හැම ආරක්ෂා කරත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා !

මිය පරලොව ගියා වූ / අපගේ ඥාති මිත්‍රාදීන් ද / අප විසින් රැස් කරගන්නා ලද්දා වූ / මේ සියලු ම පින්, / අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා ! අනුමෝදන් වෙත්වා !

ඔවුන් පතන්නා වූ බෝධියකින් / සුවසේ නිවන් දකිත්වා ! එතෙක් නිදුක් නිරෝගී / සුවපත් වූ සිත් ඇත්තෝ වෙත්වා ! කැමති කැමති තාක් දේ / නිදුකින් ලබත්වා ! කැමති කැමති තාක් දේ / නිදුකින් වඩත්වා ! කැමති කැමති තාක් දේ / නිදුකින් දෙත්වා ! කලට වේලාවට, / ශාසනය ආරක්ෂා කරත්වා ! දේශනය ආරක්ෂා කරත්වා ! අප හැම ආරක්ෂා කරත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා ! සුවපත් වෙත්වා !

## ප්‍රාර්ථනා කිරීම

අප විසින් රැස් කරගන්නා ලද්දා වූ / මේ මහා පුණ්‍ය සම්භාරයෙන්, / කෙටි ම කාලයකින්, / පහසු ම ආකාරයෙන්, / සුඛ ප්‍රතිපදාවෙන්, සියලු දුකින් මිදෙම්වා ! මේ සියලු කෙළෙස් බරින් / නිදහස් වෙම්වා ! අජර වූ / අමර වූ / නිවන ලැබ සැනසෙම්වා !

සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා !

මේ මොහොතෙහි පටන් / නිවන් දක්නා මොහොත දක්වා / සැම කල්හි, / සම්මා දිට්ඨික වන්නෙම්වා ! ත්‍රිහේතුක වන්නෙම්වා ! සීල සම්පන්න වන්නෙම්වා ! පහසුවෙන් සිල් රකින්නෙම්වා ! සමාධි සම්පන්න වන්නෙම්වා ! ප්‍රඥා සම්පන්න වන්නෙම්වා ! නිදුක් වන්නෙම්වා ! නිරෝගී වන්නෙම්වා ! බාලයන්ගේ ඇසුර නො ලබන්නෙම්වා ! බාලයන්ගෙන් අල්පමාත්‍ර හෝ / බලපෑමකට ලක් නො වන්නෙක් වෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ට හෝ / සත්පුරුෂයන්ට එරෙහිව / සිතුවිලි මාත්‍රයක්වත් නූපදවන්නෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ගේ / ඇසුර ලබන්නෙම්වා ! කල්‍යාණ මිත්‍රයන්ගේ / විශේෂ අනුකම්පාව ලබන්නෙම්වා !

සද්ධා සම්පන්න වන්නෙම්වා ! සති සම්පන්න වන්නෙම්වා ! වීර්ය සම්පන්න වන්නෙම්වා ! සමාධි සම්පන්න වන්නෙම්වා ! ප්‍රඥා සම්පන්න වන්නෙම්වා !

නිර්මල පර්යාප්තිය අසන්නෙම්වා ! ධරන්නෙම්වා ! වචනයෙන් පුරුදු පුහුණු වන්නෙම්වා ! අර්ථ පිරික්සන්නෙම්වා ! නුවණින් විනිවිද දකින්නෙම්වා ! නිවැරදිව අන්‍යයන්ට දේශනා කරන්නෙම්වා !

නිදුකින් සමථය වඩන්නෙම්වා ! නිදුකින් විදර්ශනා වඩන්නෙම්වා ! කැමති කැමති තාක් සමාපත්තීන්ට / කැමති කැමති තාක් කාලයක් සමවදින්නෙම්වා !

කැමති කැමති තාක් දේ / නිදුකින් ලබන්නෙම්වා ! කැමති කැමති තාක් දේ /නිදුකින් වඩන්නෙම්වා ! කැමති කැමති තාක් දේ / නිදුකින් දෙන්නෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා ! සුවපත් වෙම්වා !